**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**

**வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு**

**MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM**

**මාධ්‍ය නිවේදනය**

## 2026 ශ්‍රී ලංකා ආර්ථික හා ආයෝජන සමුළුව පිළිබඳ කොළඹ පිහිටි රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල දැනුවත් කිරීමේ වැඩසටහන

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, ලංකා වාණිජ මණ්ඩලය සමඟ එක්ව, " ශ්‍රී ලංකා ආර්ථික හා ආයෝජන සමුළුව - 2026" පිළිබඳව කොළඹ පිහිටි රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල දැනුවත් කිරීමේ වැඩසටහනක් 2026 අගෝස්තු 20 වැනි දින ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා හා උපායමාර්ගික අධ්‍යයන ආයතනයේදී පැවැත්වීමට පහසුකම් සලසන ලදී.

ආරාධිත අමුත්තන් පිළිගනිමින්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු (ද්විපාර්ශ්වික) අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, ශ්‍රී ලංකාව වෙළෙඳ හා ආයෝජන කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථානගත කිරීමේදී පෞද්ගලික සහ රාජ්‍ය අංශ අතර පවතින මූලික සබඳතාවයේ වැදගත්කම අවධාරණය කළේය.

විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍ය අරුණ් හේමචන්ද්‍ර මහතා, ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජන සඳහා වර්ධනය වෙමින් පවතින අවස්ථා මෙන්ම නැගී එන වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමේ හැකියාව පිළිබඳව සිය අදහස් දැක්වීමේදී අවධාරණය කළේය. ඉහළ මට්ටමේ රාජ්‍ය–පෞද්ගලික හවුල්කාරිත්වයන් තවදුරටත් ශක්තිමත් කිරීමේ වැදගත්කම අවධාරණය කළ ඔහු, තිරසාර ආර්ථික වර්ධනය හා සංවර්ධනය මෙහෙයවීමේදී පෞද්ගලික අංශයේ තීරණාත්මක කාර්යභාරයද පෙන්වා දුන්නේය.

මෙම අවස්ථාවේදී අදහස් දක්වමින්, ලංකා වාණිජ මණ්ඩලයේ සභාපති ක්‍රිෂාන් බාලේන්ද්‍ර මහතා, වාණිජ මණ්ඩලයේ වාර්ෂික ප්‍රමුඛතම වැඩසටහන වන ශ්‍රී ලංකා ආර්ථික හා ආයෝජන සමුළුවේ අරමුණු සහ වැදගත්කම පිළිබඳව පැහැදිලි කළේය. අනතුරුව, ලංකා වාණිජ මණ්ඩලයේ මහ ලේකම් සහ ප්‍රධාන විධායක නිලධාරී ශිරාන් ප්‍රනාන්දු මහතා, සමුළුව පිළිබඳ සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක් සිදු කරමින්, එහි ප්‍රධාන විශේෂාංග, ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය මෙන්ම විදේශීය නියෝජිත කණ්ඩායම් සඳහා ලබා ගත හැකි පහසුකම් සහ සූදානම් කර ඇති විධිවිධාන පිළිබඳව අවධාරණය කළේය.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන මඟින් රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල වෙත සමුළුව සහ එහි ප්‍රධාන අරමුණු පිළිබඳ සමස්ත අවබෝධයක් ලබා දුන් අතර, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සහභාගීත්වය සහ ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ අඛණ්ඩ සහභාගීත්වය සහ සහයෝගය තවදුරටත් ලබා දෙන ලෙස දිරිමත් කරන ලදී.

ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරනු ලබන ශ්‍රී ලංකා ආර්ථික හා ආයෝජන සමුළුව, 2026 ඔක්තෝබර් 12 සහ 13 යන දෙදින තුළ කොළඹ ෂැන්ග්‍රි-ලා හෝටලයේදී පැවැත්වීමට නියමිතය. ශ්‍රී ලංකාවේ තිරසාර ආයෝජන සහ ආර්ථික වර්ධනය සඳහා පවතින අවස්ථා පුළුල් කිරීමත්, ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් සහ පෞද්ගලික අංශයේ සහභාගීත්වය ශක්තිමත් කිරීමත් මෙම සමුළුවේ අරමුණ වේ.

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**
**කොළඹ**

**2026 අගෝස්තු 24 වැනි දින**


**Foreign Affairs**
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்

**Republic Building, Colombo 1**
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1

☎ 2 325 373/5, 2 207 200/7
✉ cypher@mfa.gov.lk

**Foreign Employment**
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு

**17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5**
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5

☎ 2 331 200
✉ info@mfe.gov.lk

**Tourism**
සංචාරක
சுற்றுலாத்துறை

**No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1**
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03, டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு (சர் ராசிக் ஃபரீத் மாவத்தை), கொழும்பு 1

☎ 2 381 798, 2 321 222
✉ secretary@tourismmin.gov.lk